නිවාස, ඉදිකිරීම් හා ජලසම්පාදන අමාත්‍යාංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවාගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු අංකය	තනතුරු නාමය	වැටුප් කාණ්ඩය	වැටුප් පරිමාණය	පුරප්පාඩු සංඛ්‍යාව
01	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-3	152,500/- 15X4,100/- 214,000/-	01
02	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන)	HM 1-3	152,500/- 15X4,100/- 214,000/-	01
03	සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-1	140,640/- 15X4,100/- 202,140/-	01
04	සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය ගිණුම්)	HM 1-1	140,640/- 15X4,100/- 202,140/-	01
05	සහකාර සාමාන්‍යාධිකාරී (කළමනාකාරීත්ව ගිණුම්)	HM 1-1	140,640/- 15X4,100/- 202,140/-	01
06	ගෘහ නිර්මාණ ශිල්පී	MM 1-1	91,690/- 10X2,480/- 15X3,450/- 168,240/-	04
07	ඉංජිනේරු (ඉදිකිරීම්)	MM 1-1	91,690/- 10X2,480/- 15X3,450/- 168,240/-	04
08	ඉංජිනේරු (විදුලි)	MM 1-1	91,690/- 10X2,480/- 15X3,450/- 168,240/-	01
09	ඉංජිනේරු (යාන්ත්‍රික)	MM 1-1	91,690/- 10X2,480/- 15X3,450/- 168,240/-	01
10	කළමනාකරු (සැලසුම්)	MM 1-1	91,690/- 10X2,480/- 15X3,450/- 168,240/-	01
11	ප්‍රමාණ සමීක්ෂක	MM 1-1	91,690/- 10X2,480/- 15X3,450/- 168,240/-	03
12	ජ්‍යෙෂ්ඨ සැලසුම් ශිල්පී	JM 1-1	72,650/- 10X1,360/- 18X2,040/- 122,970/-	01
13	ප්‍රමාණ සමීක්ෂක	JM 1-1	72,650/- 10X1,360/- 18X2,040/- 122,970/-	03

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම හා පළපුරුද්ද;

1.1 බාහිර අයදුම්කරුවන් :-

සිවිල් ඉංජිනේරු හෝ වාස්තු විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM 1-1) සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

2.1 බාහිර අයදුම්කරුවන් :-

i. සැලසුම්කරණය, පර්යේෂණ හා සංවර්ධනය, කළමනාකරණය, වාණිජ්‍ය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/ Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

2.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම හා පළපුරුද්ද;

3.1 බාහිර අයදුම්කරුවන් :-

සිවිල් ඉංජිනේරු හෝ ප්‍රමාණ සමීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/ Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

3.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය ගිණුම්)

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම හා පළපුරුද්ද;

4.1 බාහිර අයදුම්කරුවන් :-

i. ගණකාධිකරණ, වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

4.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

5. සහකාර සාමාන්‍යාධිකාරී (කළමනාකාරීත්ව ගිණුම්)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම හා පළපුරුද්ද;

5.1 බාහිර අයදුම්කරුවන් :-

i. ගණකාධිකරණ, වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

ii. විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (Fellow Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

5.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමග විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

6. ගෘහ නිර්මාණ ශිල්පී

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

6.1 බාහිර අයදුම්කරුවන් :-

i. වාස්තු විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

6.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (JM 1-1) විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7. ඉංජිනේරු (ඉදිකිරීම්)

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

7.1 බාහිර අයදුම්කරුවන් :-

i. සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

හෝ

ii. ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයට අදාළව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

7.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

8. ඉංජිනේරු (විදුලි)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

8.1 බාහිර අයදුම්කරුවන් :-

i. විදුලි ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

හෝ

ii. ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයට අදාළව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

8.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

9. ඉංජිනේරු (යාන්ත්‍රික)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

9.1 බාහිර අයදුම්කරුවන් :-

i. යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

හෝ

ii. ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයට අදාළව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

9.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

10. කළමනාකරු (සැලසුම්)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

10.1 බාහිර අයදුම්කරුවන් :-

i. සැලසුම්කරණය, පර්යේෂණ හා සංවර්ධනය, කළමනාකරණය, වාණිජ්‍ය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

10.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ (JM 1-1) තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

11. ප්‍රමාණ සමීක්ෂක(MM 1-1)

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

11.1 බාහිර අයදුම්කරුවන් :-

i. ප්‍රමාණ සමීක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (7) වැනි මට්ටමට අඩු නොවන්නා වූ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

සහ

ඉහත සුදුසුකම සම්පූර්ණ කිරීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

11.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ (JM 1-1) තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

12. ජ්‍යෙෂ්ඨ සැලසුම් ශිල්පී

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

12.1 බාහිර අයදුම්කරුවන් :-

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (7) වැනි මට්ටමට අඩු නොවන්නා වූ සැලසුම් ශිල්පය පිළිබඳව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

හෝ

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (6) වැනි මට්ටමට අඩු නොවන්නා වූ සැලසුම් ශිල්පය පිළිබඳව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් ක්ෂේත්‍රයට අදාළව වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

iii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටමට නොඅඩු මට්ටමක සැලසුම් ශිල්පය පිළිබඳව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් ක්ෂේත්‍රයට අදාළව වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

12.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5)වැනි මට්ටමට අඩු නොවන්නා වූ සැලසුම් ශිල්පය පිළිබඳ ප්‍රවීනතා සහතිකය ලබා තිබීම

සහ

කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2) සේවා ගණයේ II ශ්‍රේණියේ සැලසුම් ශිල්පී තනතුරේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

13. ප්‍රමාණ සමීක්ෂක (JM 1-1)

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;

13.1 බාහිර අයදුම්කරුවන් :-

i. ප්‍රමාණ සමීක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හෝ

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (7) වැනි මට්ටමට අඩු නොවන්නා වූ ප්‍රමාණ සමීක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

හෝ

iii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (6) වැනි මට්ටමට අඩු නොවන්නා වූ ප්‍රමාණ සමීක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් ක්ෂේත්‍රයට අදාළව වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

iv. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රමාණ සමීක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් ක්ෂේත්‍රයට අදාළව වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

13.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටමට අඩු නොවන්නා වූ ප්‍රමාණ සමීක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීනතා සහතිකය ලබා තිබීම

සහ

කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2) සේවා ගණයේ II ශ්‍රේණියේ සහකාර ප්‍රමාණ සමීක්ෂක තනතුරේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවකුම,

- ➤ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- ➤ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- ➤ විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

- ➤ වෛද්‍ය ප්‍රතිලාභ
- ➤ නිවාඩු දින දීමනා
- ➤ දිරි දීමනා හා ප්‍රසාද දීමනා
- ➤ වෘත්තීය දීමනා(JM 1-1 වැටුප් කාණ්ඩයේ තනතුරු හැර) හා අනුමත අනෙකුත් දීමනා
- ➤ රාජකාරි ගමන් වියදම් හා සංයුක්ත දීමනා
- ➤ සහනදායී පොලී ප්‍රතිශතයක් යටතේ සේවක නිවාස පහසුකම් (මාණ්ඩලික නිවාස ණය, ආපද ණය පහසුකම්), චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන, සන්නිවේදන දීමනා ඇතුළු වෙනත් සුබ සාධන පහසුකම්

ඉහත තනතුරු සඳහා,

පත්වීමේ ස්වභාවය : ස්ථිර

පුරප්පාඩු සේවා ස්ථානය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ප්‍රධාන කාර්යාලය

වයස් සීමාව : HM 1-3 සහ HM 1-1 වැටුප් කාණ්ඩයට ඇතුළත් තනතුරු සඳහා වයස් සීමාව අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතුය.
MM 1-1 සහ JM 1-1 වැටුප් කාණ්ඩයට ඇතුළත් තනතුරු සඳහා වයස් සීමාව අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

ඉහත සඳහන් වයස් සීමාවන් අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා/ රජයේ / රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක සේවයේ නියුතු සේවකයින්ට බල නොපෑවැත්වේ.

දැනට රජයේ / රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානී මගින් තම අයදුම්පත් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

එසේම ඔබ විසින් ඉහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා ඔබගේ අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

අ - ජීව දත්ත අයදුම්පත

ආ - සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්

ඇ - ඔබ සම්බන්ධ කරගත හැකි දුරකථන අංක

ඈ - ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද ඡායා පිටපතක්

ඔබ අයදුම් කරන තනතුර සඳහා අයදුම්පත් භරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පත්වීම් බලධාරියා විසින් තියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, ඉහළම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරාගැනීම් සිදු කෙරේ.

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුවේ.

සියලුම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක්(ඥාති නොවන දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව) සකස් කර අදාළ සහතික වල සහතික කරන ලද ඡායා පිටපත්ද සමග මෙම දැන්වීම පළ වී දින 14 ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සැ. යු. : අසම්පූර්ණව යොමු කරනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව ස